අධ්‍යාපන අමාත්‍යාංශය
**(නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් අංශය)**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

**මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය - ඔරුගොඩවත්ත (Japan Tec)**

***ආධුනිකයින් බඳවා ගැනීම - 2025 වසර***

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ ක්‍රියාත්මකවන ජපන් - ශ්‍රී ලංකා මිත්‍රත්වය මත ජපන් රජය මගින් ප්‍රදානය වූ මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ පවත්වනු ලබන පහත සඳහන් පූර්ණ කාලීන පාඨමාලා සඳහා 2025 වර්ෂයට

ආධුනිකයින් බඳවා ගැනීම පිණිස වයස අවුරුදු 16 ට නොඅඩු 25 ට නොවැඩි ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **අයදුම්පත් කැඳවනු ලබන පූර්ණ කාලීන පාඨමාලා :**

| 1 | *පූර්ණ කාලීන පාඨමාලා* | *කාලය* | *පාඨමාලා ගාස්තු (දිවා) ** | *බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1.1 | මෝටර් රථ කාර්මික ශිල්පී - Automobile Technician | අවු. 03 | රු. 200,000 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයෙන් සිංහල, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවතාවකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබීම. |
| 1.2 | මෝටර් රථ විදුලි කාර්මික ශිල්පී - Automobile Electrician | අවු. 03 | රු. 200,000 | |
| 1.3 | යන්ත්‍ර ශිල්පී - Machinist/CNC | අවු. 03 | රු. 170,000 | |
| 1.4 | මෝටර් රථ වායු සමීකරණ කාර්මික ශිල්පී Automobile A/C Mechanic | අවු. 02 | රු. 70,000 | |
| 1.5 | මෝටර් රථ ටින්කර් ශිල්පී Automobile Tinker | අවු. 1 ½ | රු. 30,000 | රජයේ හෝ රජය විසින් පිළිගන්නා ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් වී තිබීම. |
| 1.6 | මෝටර් රථ පින්තාරු ශිල්පී Automobile Painter | අවු. 1 ½ | රු. 30,000 | |

* දිවා පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් බඳවා ගැනීමෙන් පසු ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය මත අයදුම්කරුවන් අතරින් සීමිත සිසුන් පිරිසක් සඳහා සන්ධ්‍යා කාලීන පාඨමාලා ආරම්භ කෙරෙන අතර ඒ සඳහා 50%ක අමතර පාඨමාලා ගාස්තුවක් අයකෙරේ.

2. **වයස :**

2025.01.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු සහ 25ට නොවැඩි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයට ම අයදුම් කළ හැකිය.

3. **පාඨමාලා පුහුණු විස්තර :**

3.1 ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ වූ නිපුණතා පාදක පුහුණුවට අනුව ද්විත්ව පුහුණු ක්‍රමවේදය ඔස්සේ සියලුම පාඨමාලා පැවැත්වේ.

3.2 ඒ අනුව 1.1 සිට 1.3 දක්වා වූ පාඨමාලාවල පළමු වසරේ ආයතනික පුහුණුව ලබාදෙන අතර එහි දී ලබාගත් න්‍යායික / ප්‍රායෝගික දැනුම සහ කුසලතාවය සහ ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ දෙවන හා තුන්වන වසර කර්මාන්තගත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හා නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ.

3.3 1.4 පාඨමාලාව සඳහා පුහුණුවේ පළමු වසරේ ආයතනික පුහුණුව ලබාදෙන අතර එහි දී ලබාගත් න්‍යායික/ ප්‍රායෝගික දැනුම කුසලතාවය සහ ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ ඉතිරි වසර කර්මාන්තගත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හෝ නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ.

3.4 1.5 සිට 1.6 පාඨමාලා සඳහා පුහුණුවේ පළමු මාස 06 ආයතනික පුහුණුව ලබාදෙන අතර එහි දී ලබාගත් න්‍යායික /ප්‍රායෝගික දැනුම, කුසලතාවය සහ ආකල්ප වර්ධනය කර ගැනීම සඳහා පාඨමාලාවේ ඉතිරි වසර කර්මාන්තගත පුහුණුව සඳහා රජයට අනුබද්ධ හෝ නොවන මෝටර් රථ ක්ෂේත්‍රයේ ආයතනවලට අනුයුක්ත කරනු ලැබේ.

3.5 1.3 පාඨමාලාවේ සී එන් සී (CNC) ප්‍රෝග්‍රැමින්, කැම් (CAM) ප්‍රෝග්‍රැමින්, ලේත් මැෂිනින් ඇතුළු මූලික යන්ත්‍රවලට අමතරව මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයට අයත් හෙඩ් ෆේසින්, බෝරිං, හෝනින්, ක්‍රෑන්ක් ග්‍රයින්ඩින් සහ ටූල් කටර් ග්‍රයින්ඩින් යන සියලුම යන්ත්‍රවල පුහුණුව ඇතුළත්ව 3.2 හි සඳහන් පරිදි පුහුණු කෙරේ.

4. **පාඨමාලා කාලය තුළ ලබාදෙන ප්‍රතිලාභ :**

4.1 සියලුම ආධුනිකයින්ට පුහුණුවේ නිරතවීමට වැඩහල් නිල ඇඳුමක්
4.2 තෝරාගනු ලබන ආර්ථික අපහසුතාවයන් ඇති ආධුනිකයින්ට ශිෂ්‍යත්ව
4.3 පාඨමාලා කාලය තුළ ඉංග්‍රීසි භාෂාව හා පරිගණක දැනුම
4.4 පුස්තකාල පහසුකම්/ආපන ශාලා පහසුකම්
4.5 ශ්‍රීලංගම බස්රථ සඳහා වාර ප්‍රවේශපත්‍ර සහන මිලට

5. **ආධුනිකත්ව ගිවිසුම :**

තෝරාගනු ලබන සෑම ආධුනිකයෙක් විසින් ම මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය සමග ආධුනිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය. ආයතනයේ විනය නීති රීතිවලට අනුව සතුටුදායක ලෙස පාඨමාලාව අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකත්ව ගිවිසුම අවලංගු කරනු ලැබේ.

6. **සහතිකපත් ප්‍රදානය :**

සාර්ථක ලෙස පුහුණුව අවසන් කර ජාතික වෘත්තීය සුදුසුකම් අවසාන ඇගයීම් පරීක්ෂණයෙන් සමත්වන ආධුනිකයින්ට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිරිනමන ජාත්‍යන්තරව පිළිගත් ''ජාතික වෘත්තීය සුදුසුකම් 4 වන මට්ටමේ සහතිකය'' (NVQ Level 4) සමග මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ සහතිකය ද ප්‍රදානය කරනු ලබයි.

7. **පාඨමාලා සඳහා තෝරා ගැනීම :**

බඳවා ගැනීමේ අධ්‍යාපන සුදුසුකම් සපුරාලන සියලුම අයදුම්කරුවන් ගණිතය සහ සාමාන්‍ය දැනීම ඇතුළත් පැය 01ක අභියෝග්‍යතා වාචික පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර ඉන් ලබාගත් ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවා තෝරා ගැනීම සිදුකරනු ලබයි. **(ලිඛිත පරීක්ෂණයට සිංහල හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පෙනීසිටිය හැකි අතර අධ්‍යයන කටයුතු සිදුකරනු ලබන්නේ සිංහල මාධ්‍යයෙන් පමණි)**

8. **අයදුම්පත් එවිය යුතු ආකාරය :**

මි. මී. 290 x මි. මී. 210 (A4) ප්‍රමාණයේ කඩදාසියක පහත සඳහන් උපදෙස් හා ආකෘතිය අනුව පිළියෙල කරගත් අයදුම්පතෙ හි පසුපිටෙහි මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනයේ දෙමටගොඩ මහජන බැංකු ශාඛාවේ ගිණුම් අංක **071100103320674** දරන ගිණුමට විභාග ගාස්තු ලෙස රු. **1,000.00** ක් බැර කර ලබාගත් ලදුපත අලවා (මාර්ගගත ක්‍රමයට හෝ CDM ක්‍රමයට කරන ලද ගෙවීම් වලංගු නොවේ.) **2024 සැප්තැම්බර් මස 11 දිනට හෝ ඊට ප්‍රථම අධ්‍යක්ෂ/විදුහල්පති, මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 69/A, බේස්ලයින් පාර, ඔරුගොඩවත්ත,** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ උඩ වම් කෙලවරේ ''ආධුනිකයින් බඳවා ගැනීම - 2025'' යනුවෙන් සඳහන් කළ යුතුය. අප ආයතනයට පැමිණ ද ඉල්ලුම්පත් නොමිලේ ලබාගත හැක. *නැතහොත්* www.aeti.edu.lk හෝ www.naita.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

**අයදුම්පත සම්පූර්ණ කිරීමට උපදෙස් :**

- අයදුම්කරුගේ අභිමතය පරිදි, ප්‍රමුඛතාවය ලබාදෙමින් පාඨමාලා තුනක් අයදුම්පතේ 10 වන ඡේදයේ සඳහන් කර අයදුම්කළ හැකි අතර දෙවන සහ තෙවන අභිමතය සඳහා තෝරාගනු ලබන්නේ සඳහන් කර ඇති අනුපිළිවෙල අනුව ඒ ඒ පාඨමාලා සඳහා ඇබෑර්තු ඇත්නම් පමණි.
- ලියාපදිංචි තැපෑලෙන් පමණක් විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු අතර නිවැරදි ලෙස ලිපිනය අයදුම්පතේ සඳහන් කළයුතුය.
- විභාග ගාස්තු ගෙවන ලද ලදුපත නිසිලෙස අයදුම්පතේ ඇලවිය යුතුය.
- ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ දැනට පූර්ණ කාලීන පුහුණුව ලබමින් සිටින අයට අයදුම් කළ නොහැක.
- **තැපෑලේ දී අස්ථානගතවන හෝ ප්‍රමාදවන අයදුම්පත්වලට මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය වග නොකියන අතර සම්පූර්ණ කරන ලද අයදුම්පත් කල් ඇතිව එවන මෙන් දන්වා සිටිනු ලැබේ.**
- වැඩිදුර තොරතුරු සඳහා ලේඛකාධිකාරී, දුරකථන අංක - 011-2572977 හෝ 011-2531844 විමසන්න.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය.